[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

# මතුගම අධ්‍යාපන කලාපය

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone
மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

## දෙවන වාර ඇගයීම - 2023

| 10 ශ්‍රේණිය | විෂයය - පෙරදිග සංගීතය | පත්‍රය I | පැය - 3 යි. |
|---|---|---|---|

නම .......................................................................................................................................

**සැලකිය යුතුයි.**

- **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (i) , (ii) , (iii) , (iv) පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.**

01. භූපාලි රාගයට අනුව සරිස, සරිගරිස ....... යන ස්වර අභ්‍යාසයේ මීළඟ පියවර වන්නේ,
 i) සරිගමගරිස ii) සරිගපගරිස iii) සරිගපධපගරිස iv) සරිගපම'ගරිස

02. “සිරි සාර අති ශාන්ත - රමණීය හෙළ දීප” යන ගීතයට වාදනය කල යුතු හින්දුස්ථානී තාලයට ගැලපෙන රිද්ම රටාව මේ අතරින් තෝරන්න.
 i) | × × × | × × × × | × × × | × × × × |
 ii) | × × × | × × × | × × × | × × × |
 iii) | × × × × | × × × × | × × × × | × × × × |
 iv) | × × | × × × | × × | × × × |

03. ස්වර මාලිකාවක ලක්ෂණයක් නොවන්නේ,
 i) තාලානුකූල වීම.
 ii) රාගයට අයත් ස්වර පමණක් යොදා ගැනීම.
 iii) පදමාලාවක් යොදා ගැනීම.
 iv) ස්ථායි, අන්තරා ආකෘතියට අනුව නිර්මාණය වීම.

04. වර්ජිත ස්වරයක් යනු,
 i) රාගයක අලංකාරය සඳහා ඉඳහිට යොදා ගන්නා ස්වරයකි.
 ii) රාගයක ප්‍රධානතම ස්වරයයි.
 iii) රාගයක කිසිසේත් නොයෙදෙන ස්වරයයි.
 iv) රාගයක දෙවනුව ප්‍රධාන වන ස්වරයයි.

05. 4/4 , 3/4 මෙවැනි සංකේත මඟින් දැක්වෙනුයේ,
 i) Time Signature ii) Treble Clef iii) Sign to Sign iv) Key Signature

06. “සීත ගඟුලෙදී ඇඳ පේවෙනවා.” මෙම ගී පාදය පිළිබඳ නිවැරදි කියමන තෝරන්න.
 i) මෙම ගීය ආඝාතාත්මක මෙහෙ ගීයකි.
 ii) මෙම ගීය අනාඝාතාත්මක සේ ගීයකි.
 iii) මෙම ගීය ආඝාතාත්මක ඇඳහිලි ගීයකි.
 iv) මෙම ගීය අනාඝාතාත්මක සමාජීය ගීයකි.

07. මව්පිය වරුණ ගීතයක් නොවන්නේ,
 i) අන්දර යායේ
 ii) අම්මා සඳකි
 iii) මට මැණී වගේ
 iv) දුනුකෙයියා මලක් වගේ

08. “දොහොරාව” ඇතුළත් වන ගීතයකි,
 i) සිරිසඟබෝධි මාලිගාවේ දී
 ii) වාසනා දිනේකි මේක
 iii) අඹ දඹ නාරං
 iv) ලියමු මේ සිංහල භාෂාවෙන්

09. ආනන්ද සමරකෝන් මහතා විසින් ගයන ලද ගීතයකි.
 i) දියගොඩ සැම තැන
 ii) බැස සීතල ගඟුලේ
 iii) ඕලු පිපීලා විල ලෙලදෙනවා
 iv) ලංකා ලංකා පෙම්බර ලංකා

10. String Instruments වර්ගයට අයත් සංගීත භාණ්ඩයකි,

i) Tuba　　ii) Saxophone　　iii) Banjo Mandolin　　iv) Tenor Drum

- ප්‍රශ්න අංක 11 සිට 13 දක්වා පහත ගී පද ඇසුරින් පිළිතුරු සපයන්න.
  - A. සඳවා සුදුවැලි පිවිතුරු
  - B. රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙලදිදී විදුලිය පබා
  - C. පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට
  - D. බුද්ධං සරණංද බලේ

11. "ගුංද ගදිගත ගත්ත ගුදි ගුඳ" යන බෙර පදයේ තාල රූපය ප්‍රකාශ වන ගී පාදය තෝරන්න.

i) A　　ii) B　　iii) C　　iv) D

12. ගීමත් ගණනට සමාන සඳැස්මත් ගණනක් යෙදෙන ගී පාද දෙක වන්නේ,

i) A හා B　　ii) A හා C　　iii) A හා D　　iv) B හා C

13. ඉහත ගී පාද අතරින් ගී පාද 3 ක් එක් ජන ගී වර්ගයකට අයත් වේ. නොගැලපෙන ගී පාදය වන්නේ,

i) A　　ii) B　　iii) C　　iv) D

14. පෘතුගීසීන් පැමිණීමෙන් පසුව ලංකාව තුළ පැතිර ගිය ගී විශේෂයකි.

i) රවින්ද්‍ර ගී　　ii) කපිරිඤ්ඤා ගී　　iii) විරිඳු ගී　　iv) කෝලම් ගී

- ප්‍රශ්න අංක 15 සිට 17 දක්වා පහත ස්වර පාදය උපයෝගී කර ගන්න.

ධ ම | ධ නි ස̇ | ධ නි | ස̇ රි̇ ස̇

15. ඉහත ස්වර පාදය පිළිබඳව නිවැරදි කියමන තෝරන්න.

i) භෛරවී රාගයට අනුව දීප්චන්දි තාලය මත ප්‍රස්තාර කර ඇත.
ii) යමන් රාගයට අනුව දීප්චන්දි තාලය මත ප්‍රස්තාර කර ඇත.
iii) භෛරවී රාගයට අනුව ඣප තාලය මත ප්‍රස්තාර කර ඇත.
iv) යමන් රාගයට අනුව ඣප් තාලය මත ප්‍රස්තාර කර ඇත.


16. එම ස්වර පාදය ප්‍රස්තාර කර ඇති දේශීය තිත් රූපය වන්නේ,


i) සුළු මැදුම් දෙතිත　　ii) මැදුම් මහ දෙතිත　　iii) සුළු තනි තිත　　iv) මැදුම් තනි තිත

17. ඉහත ස්වර පාදය අයත් රාගයේ වාදී සංවාදී ස්වර පිළිවෙලින් දැක්වෙන වරණය තෝරන්න.

i) ග හා නි　　ii) ම හා ස　　iii) ග හා ධ　　iv) ධ හා ග

- ප්‍රශ්න අංක 18 සිට 21 දක්වා පහත රූප සටහන් යොදා ගන්න.


A


B


C


D

18. ඉහත සංගීත භාණ්ඩ පිළිවෙලින් නම් කළ වරණය තෝරන්න.

i) හාමෝනියම් , සිතාරය , ගිටාර් , එකෝඩියන්
ii) සිතාරය , හාමෝනියම් , ගිටාර්, එකෝඩියන්
iii) සිතාරය , එකෝඩියන් , ගිටාර් , හාමෝනියම්
iv) හාමෝනියම් , එකෝඩියන් , සිතාරය , ගිටාරය

19. මේ අතරින් අපරදිග සංගීතයට අයත් නොවන සංගීත භාණ්ඩ යුගලය වන්නේ,
   i) A හා B   ii) B හා C   iii) A හා C   iv) B හා D

20. ඉහත වාද්‍ය භාණ්ඩ සම්බන්ධව වැරදි කියමන තෝරන්න.
   i) A භාණ්ඩය තත් 7 කින් යුක්තය. මිස්රාබයෙන් වයයි.
   ii) B භාණ්ඩය සුෂිර භාණ්ඩයකි. බැලෝව දිග හැරීමෙන් හා හැකිලීමෙන් නාදය නිපදවිය හැකි ය.
   iii) C භාණ්ඩය තත් 6 කින් යුක්තය. Pick ආධාරයෙන් වයයි.
   iv) D තූර්ය වාදන කණ්ඩායම් සඳහා යොදා ගනී. වම්පස Bass Button පිහිටා ඇත.

21. බටහිර වර්ගීකරණයට අනුව Wind Instrument වර්ගයට අයත් වාද්‍ය භාණ්ඩය වන්නේ,
   i) A   ii) B   iii) C   iv) D

22. ගොයම් දා මගුල, මහාභිනිෂ්ක්‍රමණය වැනි දේශීය සංධ්වනි නිර්මාණකරු වන්නේ,
   i) එදිරිවීර සරච්චන්ද්‍ර සූරින්   ii) ලයනල් අල්ගම සූරින්
   iii) ඩබ්.බී.මකුලොලුව සූරින්   iv) සී ද එස් කුලතිලක සූරින්

- ප්‍රශ්න අංක 23 සිට 26 දක්වා පහත තබ්ලා අක්ෂර උපයෝගී කරගන්න.

**| තිං තිං නා | ති ට ති ට | තිං තිං නා | තූ න තූ න |**

23. ඉහත අක්ෂර සියල්ල නිකුත් කළ හැකි වන්නේ,
   i) බායාවෙන් පමණි.   ii) දායාවෙන් පමණි.
   iii) දායාව හා බායාව එකවර වැයීමෙනි.   iv) දායාවෙන් හා බායාවෙන් වෙන් වෙන් වශයෙන් වැයීමෙනි.

24. ඉහත රටාවට අනුරූප හින්දුස්ථානී තාලය වන්නේ,
   i) ත්‍රිතාලය   ii) ඣප්තාලය   iii) දීප්චන්දි තාලය   iv) දාදරා තාලය

25. ඉහත රිද්ම රටාවට අනුරූප හින්දුස්ථානී තාලයට අනුව ගැයිය හැකි ගී පාදය තෝරන්න.
   i) සවන පිනන ගීත මිහිර   ii) පෙරදිග මුතු ඇටයයි මේ
   iii) මොකද මැණිකේ හනික යන්නේ   iv) සත් වෙත් මහත් අදර

26. ඉහත රිද්ම රටාවට අනුරූප හින්දුස්ථානී තාලයේ තාල සංඥා යෙදිය යුතු නිවැරදි අනුපිළිවෙල වන්නේ,
   i) × 0 2 3   ii) × 2 0 3   iii) 0 2 × 3   iv) 0 3 × 2

27. "නන් සිරින් වොරැදි" මෙම නව නාට්‍ය ගීතයේ තනුවට පාදක වූ පැරණි නාඩගම් ගීතය වනුයේ,
   i) සත් වෙත සෙත් දෙන   ii) ගගන රිවි සොමි
   iii) දුල් නිමල් සිසි සේ   iv) යානත අතුල මල් පෙති

28. සී ද එස් කුලතිලක මහතා විසින් නිර්මාණය කරන ලද ගීතයක් වන්නේ,
   i) සකිය සගච්චට   ii) ගම අවුලඤ්ඤං
   iii) දැතට වළලු   iv) මල් සරා බැල්ම හෙලා

29. පෙර පිහිටි විභාගයේ ස්වරම නැවත වාදනය කල යුතු බව හැඟවීමට යොදන සංකේතය තෝරන්න.
   i) ⁒   ii) %.   iii) [ ]   iv) ||: :||

30. කපිරිඤ්ඤා ගීත ආභාසය නොලද ගීතය මේ අතරින් කුමක් ද?
   i) මංගෝ කලු නැන්දේ   ii) රස ආහාර කවලා
   iii) යමන් බණ්ඩෝ වෙසක් බලන්න   iv) අයිරින් ජොසපින් රොසලින්

31. ශ්‍රී ලංකාවේ නව නාට්‍ය කලාවේ පුරෝගාමියා වන්නේ,
i) ආනන්ද සමරකෝන් මහතා
ii) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා
iii) ඩබ්.බී. මකුලොලුව මහතා
iv) සුනිල් ශාන්ත මහතා

32. රේලා, චක්‍රදාර් , තිහායි ආදී වාදන අංගයන් වාදනය කරනු ලබන්නේ,
i) වයලීනය මඟිනි.
ii) තබ්ලාව මඟිනි.
iii) එස්රාජයෙනි.
iv) සිතාරය මඟිනි.

33. පොතේගුරු, සෙල්ලම් ළමා වැනි චරිත දක්නට ලැබෙන රංග ශෛලිය,
i) නූර්ති
ii) කෝළම්
iii) නාඩගම්
iv) සොකරි

34. උකුසා වන්නමේ නාද මාලාව ඇසුරින් නිර්මිත සරල ගීතයක් වන්නේ,
i) මල්සරා බැල්ම හෙලා
ii) රුක් අත්තන මල මුදුනේ
iii) කහමලියේ
iv) ආදරයේ උල්පත වූ අම්මා

35. වන්දි භට්ටයන් නමින් විශේෂ ගායන කණ්ඩායමක් විසින් ගායනා කරනු ලබන ගීත විශේෂය කුමක් ද?
i) වන්නම්
ii) ප්‍රශස්ති ගී
iii) හටන් ගී
iv) කෝළම් ගී

36. ගිටාරය සුසර කරනු ලබන ස්වර නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
i) E A D G B E
ii) E A G D B E
iii) E D G B A E
iv) E D G A B E

37. විෂ්ණු නාරායන් භාත්ඛණ්ඩේ පඬිතුමා විසින් හඳුන්වා දුන් ථාට ගණන,
i) 12 කි
ii) 14 කි
iii) 10 කි
iv) 08 කි

38. ප්‍රසංග වේදිකාවේ දී ගායනයක් ප්‍රේක්ෂකයා වෙත මුදා හරිනුයේ,
i) ඇම්ප්ලිෆයර් මගිනි.
ii) බෆල් මගිනි.
iii) මයික්‍රෆෝනය මගිනි.
iv) මික්සර් මගිනි.

39. තාලයක යෙදෙන ප්‍රබලතම තාලස්ථානය වන්නේ,
i) සමග්‍රහයයි
ii) දෙවන අනුතාලයයි
iii) තෙවන අනුතාලයයි
iv) ඛලියයි

40. සරල ගීතයක සාමාන්‍ය ආකෘතිය පිළිවෙලින්,
i) ස්ථායි , පෙරවාදනය , අන්තරා , අතුරු වාදනය
ii) පෙරවාදනය , අතුරු වාදනය , ස්ථායි , අන්තරා
iii) පෙරවාදනය , ස්ථායි , අතුරු වාදනය , අන්තරා
iv) අන්තරා , පෙරවාදනය , ස්ථායි , අතුරු වාදනය

(ලකුණු 01 × 40 = 40)

## II කොටස

**සැලකිය යුතුයි.**

- **පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01\. 1) “පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට” මෙම ගීය ගායනා කරනු ලබන විරිත කුමක් ද?

2) රාගයක තොරතුරු ඇතුළත් වන ගීත විශේෂය කුමක් ද?

3) ගුවන් විදුලියේ පටිගත කළ මුල්ම සරල ගීතය කුමක් ද?

4) ග්‍රැමෆෝනය ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් වර්ෂය කුමක් ද?

5) නූර්ති සංගීතය සඳහා වාදනය කරනු ලබන ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩය හා ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය අනුපිළිවෙලින් ලියා දක්වන්න.

6) රාගයක ආරෝහණ, අවරෝහණයේ වාදී සංවාදි ස්වර හැරුණු විට ඉතිරි ස්වර හඳුන්වනු ලබන නාමය කුමක් ද?

7) ශ්‍රී ලංකේය කණ්ඩායම් සංගීතයේ නිර්මාතෘවරයා නම් කර ශ්‍රී ලංකාවේ බිහි වූ මුල්ම ගායක කණ්ඩායමක් නම් කරන්න.

8) ස්වර 12 ම යොදා ගත හැකි නිර්දේශිත රාගය නම් කරන්න.

9) නාඩගම් රංග ශෛලියේ ගීත ගායනයේ දී දෘතලයෙන් ගැයෙන විශේෂ සංගීතාංගය හඳුන්වන නම සඳහන් කරන්න.

10) කපිරිඤ්ඤා ගායනයේ දී සිදු කරන නර්තනය හඳුන්වනු ලබන්නේ කුමන නමින් ද?

02\.

A | ප ප ධ නි | ස̇ - ස̇ ස̇ | ධ නි ස̇ රි̇ | ස̇ නි ධ ප |

B | ධ̲ ම ධ̲ | නි̲ ස̇ - | ධ̲ නි̲ ස̇ | රි̲̇ ස̇ - |

C | ග ග ප ධ | ප ස̇ - ස̇ | නි රි̇ ග̇ රි̇ | ස̇ නි ධ ප |

D | ම ම ප ධ | නි නි ස̇ | රි̇ ග̲̇ රි̇ ස̇ | නි̲ ධ නි̲ - |

1) ඉහත A , B , C , D ස්වර පාද අයත් රාග පිළිවෙලින් නම් කරන්න. (ල. 04)

2) B හෝ C රාග දෙකෙන් එක් රාගයක මධ්‍යලය ගීතයක් ස්ථායි කොටස නියමිත තාල සංඥා සහිතව ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 04)

3) ඉහත රාග අතරින් කල්‍යාණ මේලගත රාගය අයත් අක්ෂර සමග රාගය නම් කර එම රාගයේ පහත විස්තර ලියා දක්වන්න.

i) ආරෝහණ ii) අවරෝහණ iii) වාදී

iv) සංවාදී v) ජාතිය vi) මුඛ්‍යාංගය (ල. 04)

03\. 1) පහත දැක්වෙන ජන ගී, ගැමි ගී වර්ගීකරණයට අනුව අයත් වන වර්ගය හඳුනාගෙන ගී පාදය ඉදිරියෙන් ලියා දක්වන්න.

i) බුද්ධං සරණේ සිරස දරාගෙන - ..........................................................

ii) දොඩම් කපාලා ඇඹුල් තනාලා - ..........................................................

iii) මලේ මලේ ඔය නා මල නෙලා වරෙන් - ..........................................................

iv) නුඹෙ අම්මා කොතැන ගියේ - ..........................................................

v) උඩින් පනින්දෝ - තල්ල කැඩෙයිදෝ - ..........................................................

vi) කලුගල් තලාලයි පාරට දමන්නේ - .......................................................... (ල. 03)

2) සේ ගී ගණයට ගැනෙන ගී වර්ග 2 ක් නම් කරන්න. (ල. 02)

3) ඔබ ඉහත 2 ප්‍රශ්නය සඳහා ඉදිරිපත් කල ගී වර්ග දෙකෙන් එක් ගී වර්ගයක් පිළිබඳ කරුණු 03 ක් ලියන්න. (ල. 03)

4) ගැමි ගී හා සේ ගී අතර දක්නට ලැබෙන විෂමතා 4 ක් සඳහන් කරන්න. (ල. 04)

04. 1) ග්‍රැමෆෝන් ගී යුගය සම්බන්ධයෙන් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| ගී යුගය | ගායක / ගායිකාවන් | නිදසුන් ලෙස යුගයට අයත් ගී පාදයක් |
|---|---|---|
| I. ........................................ | II. .................................................. | දුල් සල් වනේ ලකල් |
| III. ...................................... | ලක්ෂ්මී බායි | IV. ................................................ |
| ස්වාධීන තනු යුගය | V. .................................................. | VI. ................................................ |

(ල. 03)

2) ග්‍රැමෆෝන් ගී යුගයේ සංගීතමය ලක්ෂණ 04 ක් ලියන්න. (ල. 04)

3) ස්වාධීන තනු යුගය ආරම්භයට පුරෝගාමී වූ ශිල්පියෙකු නම් කරන්න. (ල. 01)

4) "ස්වාධීන තනු යුගයේ දී ශ්‍රී ලාංකේය සරල ගීතය නවමු මුහුණුවරක් ගන්නා ලදී." මෙම කියමන අනෙකුත් යුග දෙක සමඟ සන්සන්දනය කරමින් තහවුරු කරන්න. (ල. 04)

05. 1) ඔබ උගත් කපිරිඤ්ඤා ගීතයක පදමාලාව ලියා දක්වන්න. (ල. 04)

2) කපිරිඤ්ඤා සංගීතයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ 04 ක් ලියා දක්වන්න. (ල. 04)

3) ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සරල ගී ආරම්භයට පුරෝගාමී වූ ශිල්පියෙකු නම් කර, එතුමන් පිළිබඳව කරුණු 03 ක් සඳහන් කරන්න. (ල. 04)

06.




1) ඉහත දැක්වෙන බටහිර ස්වර ප්‍රස්තාරයේ A , B , C , D සංකේත නම් කරන්න. (ල. 04)

2) ඉහත ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට හරවා ප්‍රස්තාර කරන්න. (ල. 04)

3) ඉහත 2 හි දී පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කල ස්වර ප්‍රස්තාරය නැවත මධ්‍යම භාවයට හරවා ප්‍රස්තාර කරන්න. (ල. 04)

07. 1) තබ්ලාවක දළ රූප සටහනක් ඇඳ කොටස් 05 ක් සලකුණු කර නම් කරන්න. (ල. 05)

2) තබ්ලා මුහුණත් ඇඳ පහත සඳහන් අක්ෂර උපදින ස්ථාන සළකුණු කරන්න.

i) ධා ii) තිං iii) තා iv) තිට v) ධිං (ල. 05)

3) තබ්ලා වාදකයෙකු විසින් තබ්ලාවක් වැයීමට පෙර සැලකිලිමත් විය යුතු කරුණු 02 ක් ලියන්න. (ල. 02)

[සියලු ම හිමිකම් ඇවිරිණි / KOg;gjpg;GupikAilaJ / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak මතුගම අධ්‍යාපන කලාපය Matugama

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 10 ශ්‍රේණිය | විෂයය - පෙරදිග සංගීතය | පත්‍රය I/ II | පිළිතුරු පත්‍රය |
|---|---|---|---|

නම ..........................................................................................................................

## I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | ii | 11. | ii | 21. | iv | 31. | ii |
| 02. | iv | 12. | iii | 22. | iii | 32. | ii |
| 03. | iii | 13. | iv | 23. | ii | 33. | iii |
| 04. | iii | 14. | ii | 24. | iii | 34. | ii |
| 05. | i | 15. | iii | 25. | iii | 35. | ii |
| 06. | iii | 16. | i | 26. | ii | 36. | i |
| 07. | iii | 17. | ii | 27. | iii | 37. | iii |
| 08. | ii | 18. | i | 28. | iii | 38. | ii |
| 09. | ii | 19. | i | 29. | i | 39. | i |
| 10. | iii | 20. | ii | 30. | i | 40. | iii |

## II පත්‍රය

01\. 1) සමුද්‍ර ඝෝෂ විරිත (ල. 01)
 2) ලක්ෂණ ගී (ල. 01)
 3) ඕලු පිපිලා විල ලෙලදෙනවා (ල. 01)
 4) 1903 (ල. 01)
 5) සර්පිනාව , තබ්ලාව (ල. 02)
 6) අනුවාදී ස්වර (ල. 01)
 7) නෙවිල් ප්‍රනාන්දු මහතා , ලොස් කැබෙලරෝස් / ලා සිලනියන්ස් (ල. 02)
 8) භෛරවී රාගය (ල. 01)
 9) උරුට්ටුව (ල. 01)
 10) බයිලා (ල. 01)

(මුළු ලකුණු 12)

02\. 1) A - බිලාවල් B - භෛරව් C - යමන් D - කාෆි (1 × 4 = ල. 04)
 2) පද හා ස්වර ප්‍රස්තාරය සඳහා
 එක් ස්වර / පද පාදයකට ල. 01 බැගින් ල. 04 යි (ල. 04)
 3) C - යමන් රාගය - (ල. 01)

| | | |
|---|---|---|
| ආරෝහණ | - | ස රි ග මˈ ප ධ නි ස̇ |
| අවරෝහණ | - | ස̇ නි ධ ප මˈ ග රි ස |
| වාදී | - | ග |
| සංවාදී | - | නි |
| ජාතිය | - | සම්පූර්ණ |
| මුඛ්‍යාංගය | - | නි̣ රි ග , රි ස , ප මˈ ග රි ස |

එක් කරුණකට ල. ½ බැගින් (½ × 6 = ල.03)

(මුළු ලකුණු 12)

03. 1) i) ඇදහිලි ගී — iv) සමාජීය ගී
ii) සමාජීය ගී — v) සමාජීය ගී
iii) මෙහෙ ගී — vi) මෙහෙ ගී — ල. ½ බැගින් (½ × 6 = ල. 03)

2) ප්‍රශස්ති, වන්නම්, හටන්, සංදේශ කාව්‍ය...... ආදී සෙගී වර්ග 2 ක් (ල. 01 × 2 = 02)

3) එක් ගී වර්ගයක් පිළිබඳව කරුණු 03 ක් ඉදිරිපත් කිරීම සඳහා එක් කරුණකට ල. 01 බැගින් (ල. 1 × 3 = ල. 03)

4)

| ගැමි ගී | සෙ ගී |
|---|---|
| 1. නාද මාලාව සරලයි | නාද මාලාව සංකීර්ණයි |
| 2. පද මාලාව සරලයි | පද මාලාව සංකීර්ණයි |
| 3. මුඛ පරම්පාගතව පැවත එයි | ග්‍රන්ථාරූඪ කර ඇත. |
| 4. කතුවරයෙක් නැත | කතුවරයෙක් ඇත |
| 5. ස්වර පරාසය පටු ය | ස්වර පරාසය පුළුල් ය |

ආදී විෂමතා 4 ක් සඳහන් කිරීම සඳහා එක් කරුණකට ල. 01 බැගින් (ල. 01 × 4 = ල. 04)
(මුළු ලකුණු 12)

04. 1) i) හින්දි තනු අනුකාරක යුගය
ii) H.W. රූපසිංහ, N. රොමිලස්, J.සාදිරිස් සිල්වා, රුක්මණී දේවි, එඩී ජයමාන්න වැනි යුගයට අයත් ගායන ශිල්පියෙක්.
iii) මුල් යුගයේ තනු ඇතුලත් යුගය
iv) * පිට දීප දේශ ජය ගන්නා
* විසෙහි විස සඳනා ලෝකේ
* ශ්‍රී රාහුල හිමිගේ නාමේ
* කරුණා මුදේ නාමු ගිලීලා වැනි යුගයට අයත් ගීතයක්
v) රුක්මණී දේවි
ආනන්ද සමරකෝන්
සුනිල් සාන්ත
H.W. රූපසිංහ වැනි යුගයට අයත් ශිල්පියෙක්
vi) මව්පියො ආදී
දැඩි කල මාතා
එන්ඩද මැණිකේ
බැස සීතල ගඟුලේ වැනි යුගයට අයත් ගීතයක් (ල. ½ × 6 = ල. 03)

2) i) අවම සංගීත භාණ්ඩ ප්‍රමාණයක් යොදා ගැනීම.
ii) කටහඬට ප්‍රධාන තැනක් ලබා දීම.
iii) විවිධ සංගීත සම්ප්‍රදායන් ඇසුරින් ගී නිර්මාණය වීම.
iv) පෙරවාදනය, අතුරු වාදනය සඳහා එකම තනුව භාවිතා වීම.
v) ඇතැම් ගී සඳහා අතුරු වාදන නොතිබීම.
වැනි කරුණු 04 ක් සැපයිය යුතු ය. එක් කරුණකට ල. 01 බැගින් (ල. 01 × 4 = ල. 04)

3) ආනන්ද සමරකෝන් සූරින් / සුනිල් සාන්ත සූරින් (ල. 01)

4) ග්‍රැමෆෝන් ගී යුගයන් සන්සන්දනය කරමින් කියමන සනාථ කිරීම. (ල. 04)

05. 1) කපිරිඤ්ඤා ගීතයේ සම්පූර්ණ පදමාලාව ලිවීමට (ල. 04)

2) i. නර්තනශීලි රිද්මයක් තිබීම.
ii. වියෝලා, ගිටාර් , රබාන ආදී වාදන භාණ්ඩ යොදා ගැනීම.
iii. සරල නාල මාලා යෙදීම.
iv. 6/8 රිද්ම රටාවට බොහෝ ගී නිර්මාණය වීම.
v. බයිලා නමින් විශේෂ නර්තනයක් තිබීම.
වැනි කරුණු 4 ක් සැපයීම සඳහා එක් කරුණකට ල. 01 බැගින් (ල. 01 × 4 = ල. 04)

3) * ආනන්ද සමරකෝන් සූරින්
   1. ශ්‍රී ලංකා ජාතික ගීයේ නිර්මාතෘවරයා ය.
   2. සිංහල නිර්මාණ සංගීතයෙහි පියාණන් ලෙස හැඳින්විය හැකි ය.
   3. බෙංගාලින් ජන ගී රටාවන් හා හෙළ ජන ගී ආර සමඟ සම්පව සංගීත ක්ෂේත්‍රයට නව පණක් දුන් සංගීතඥයෙකි.
   4. ශාන්ති නිකේතනයෙන් අධ්‍යාපනය ලැබීම.
   5. මෙතුමාගේ ගීත ප්‍රබන්ධ සරල හා සුගම බවින් යුතු ය.

 * සුනිල් සාන්ත සූරින්
   1. ශ්‍රී ලංකා ගුවන් විදුලියේ පටිගත කල මුල්ම ගීතය වන “ඕලූ පිපිලා විල ලෙල දෙනවා” ගීතයේ නිර්මාණකරුවා ය.
   2. ශාන්ති නිකේතනයෙන් සංගීත අධ්‍යාපනය ලැබීම.
   3. රේඛාව චිත්‍රපටයේ ගී තනු රචකයා ය.
   4. නිවැරදි වියත් බස ඔහුගේ පද රචනා තුල දක්නට ඇත.
   5. දේශීය සංගීතය උදෙසා උද්යෝගයෙන් කටයුතු කළ සංගීතඥයෙකි.


ශිල්පියෙක් නම් කිරීමට (ල. 01)
එක් කරුණකට ල.01 බැගින් (ල. 01 ×3 = ල. 03)

06. 1) A - Treble clef B - Time Signature
C - Minim C - Tie (ල. 01 × 4 = ල. 04)

2) | ග ම ප | ම - ග | රි - - | - - - |
එක් විභාගයකට ලකුණු 01 බැගින් (ල. 04)


3) | ධ <u>නි</u> සං | <u>නි</u> - ධ | ප - - | - - - |
එක් විභාගයකට ල. 01 බැගින් (ල. 04)
(මුළු ලකුණු 12)

07. 1)




එක් කොටසකට ලකුණු 1 බැගින් (ල. 1× 5 = ල. 05)

2)




(ල. 1× 5 = ල. 05)

3) i. තබ්ලාවේ කොටස් වාදනය සුදුසු පරිදි තිබේදැයි සොයා බැලීම.
ii. අවශ්‍ය ශ්‍රැතියට අනුව සුසර කර ගැනීම.
iii. තබ්ලාවේ සම පලුදු වී ඇත්දැයි බැලීම.
iv. වාදනයට පහසුවන ආකාරයට ස්ථානගත කර ගැනීම.
ආදී කරුණු 01 කට ල. 01 බැගින් (ල. 01 × 02 = ල. 02)

(මුළු ලකුණු 12)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න